සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

| 9 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකයः

සැලකිය යුතුයි.

- පළමු කොටසේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සුරියුත් තෙරණුවන් පිරිනිවන් පා වදාළේ,
    (1) කාලශිලාවේදී ය. (2) භෝග නගරයේදී ය.
    (3) නාලක ගමේදී ය. (4) විශාලා මහනුවරදී ය.

02. බුදු සිරිතෙහි විශිෂ්ට චරිත ලක්ෂණයක් නොවන්නේ,
    (1) අකාරුණික බව. (2) චරිතවත් බව.
    (3) ආදර්ශවත් බව. (4) අකම්පිත බව.

03. ත්‍රිකෝටික පාරිශුද්ධ සීලය ලෙස හඳුන්වන්නේ,
    (1) දස සීලයයි. (2) ආජීව අෂ්ටමක සීලයයි.
    (3) හිරි හා ඔත්තප්පයයි. (4) සීලය තුන් ආකාරයකින් ආරක්ෂා කිරීමයි.

04. භික්ෂුණී ශාසනයේ අභිඥාලාභී භික්ෂුණීන් වහන්සේලා අතර අග්‍රස්ථානයට පත්වූයේ,
    (1) ඛේමා තෙරණියයි. (2) යසෝදරා තෙරණියයි.
    (3) විශාඛා තෙරණියයි. (4) ප්‍රජාපති තෙරණියයි.

05. ත්‍රිවිධ රත්නය සතු ගුණ ගණන,
    (1) හයකි. (2) අටකි. (3) නවයකි. (4) විසි හතරකි.

06. අන් අය විසින් තමන්ගේ ගුණ වර්ණනා කිරීම,
    (1) ප්‍රශංසාවයි. (2) දුකයි. (3) අයසයි. (4) සැපයයි.

07. බුදුරජාණන් වහන්සේට රළු ආහාර දානය පිණිස පිළිගැනීමට සිදුවූයේ,
    (1) ජේතවනාරාමයේදී ය. (2) පාරිලෙය්‍ය වනයේදී ය.
    (3) වේළුවනාරාමයේදී ය. (4) වේරංජාවේදීය.

08. පරලොවක් නැතැයි සිතා මෙලොව හැකිතාක් සැප විඳීමට ඇතිවන ආශාව,

(1) කාම තණ්හාවයි. (2) භව තණ්හාවයි.

(3) විභව තණ්හාවයි. (4) තෘෂ්ණාවයි.

09. සැහැල්ලු දිවි පැවැත්ම ලෙස හඳුන්වන්නේ,

(1) නිපකය. (2) සුභරෝය. (3) සල්ලහුකවුත්තිය. (4) උජුය.

10. සිත, කය, වචනය ලෙස හඳුන්වනු ලබන්නේ,

(1) තිදොරයි. (2) ත්‍රිපිටකයයි. (3) ත්‍රිවිද්‍යාවයි. (4) ත්‍රිලක්ෂණයයි.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු දී ඇති වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(චේතනාව / ද්වේශය / අකම්පිත වීම / කය / සිව්වනක් පිරිස / මෛත්‍රිය / බහුශ්‍රැතබව)

11. මිනිස් සිරුර සැකසී තිබෙන්නේ සිත හා ............................................................................ යන දෙඅංශයෙන් ය.

12. මාගන්දියා, චිඤ්චාමානවිකාව වැනි අයගේ නින්දා අපහාස ............................................................ තුළින් බුදුරජාණන් වහන්සේගේ ඒ මහා ගුණය ප්‍රකට කළ සේක.

13. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා ........................................................................................ ලෙස හැඳින්වේ.

14. කුසල හා අකුසල කර්ම ........................................................................................................ මුල්වීමෙන් සිදුවේ.

15. කෙලෙස් සිතුවිල්ලක් ලෙස ................................................................................................. බුදු දහමේ දැක්වේ.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල දක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහනෙහි යොදන්න.**

16. ශරීරයට අධික ලෙස දුක ලබා දීම කාමසුඛල්ලිකානුයෝගයයි. ( )

17. මිහින්තලේ සේල චෛත්‍යයේ බුදුරදුන්ගේ ඌර්ණ රෝම ධාතුව නිදන්කර තිබේ. ( )

18. සිදුහත් බෝසතාණෝ ඇසළ පොහෝ දින බුද්ධත්වයට පත් වූ සේක. ( )

19. ධම්ම පදය ග්‍රන්ථය විනය පිටකයට අයත් වේ. ( )

20. වැවයි දාගැබයි, ගමයි පන්සලයි සංකල්පය සහජීවනයට මඟපෙන්වයි. ( )

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

**සැළකිය යුතුයි**

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, 02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) සම්බුද්ධ පරිනිර්වාණය සිදුවූයේ කුමන ස්ථානයේදී ද?

(ii) රූප මදයෙන් උඩඟුව ක්‍රියාකළ රජ බිසව නම් කරන්න.

(iii) භික්ෂු ශාසනය ආරම්භ වූයේ කිනම් පොහොය දිනක ද?

(iv) ත්‍රිවිධ ශික්ෂාව නම් කරන්න.

(v) ථූපාරාම චෛත්‍යයේ ඇති ආගමික වැදගත්කම ලියන්න.

(vi) ''නිවන පරම සුවයයි'' යන්න පාලියෙන් ලියා දක්වන්න.

(vii) ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 2 ක් ලියන්න.

(viii) ධම්ම පදය අයත්වන නිකාය සඳහන් කරන්න.

(ix) භාවනා කිරීම සඳහා ගැහැනු ළමුන් හා පිරිමි ළමුන් වාඩිවෙන ඉරියව් දෙක ලියන්න.

(x) ලෝක පාලක ධර්ම නම් කරන්න. (ලකුණු $2 \times 10 = 20$)

02. (i) සංඝ රත්නයේ ගුණ අතුරින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉන් එක් ගුණයක් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) භික්ෂූන් වහන්සේගේ පැවැත්මට ගිහියා දායක විය යුතු ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 05)

03. (i) චතුරාර්ය සත්‍යය අතුරින් කරුණු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) සීල ශික්ෂාවට අයත් මාර්ග අංග නම් කරන්න. (ලකුණු 03)

(iii) ඉන් එක් මාර්ගාංගයක් විස්තර කරන්න. (ලකුණු 05)

04. (i) බුදුරජාණන් වහන්සේ මානව යුතුකම් දක්වා ඇත්තේ කුමන සූත්‍රයෙන් ද? (ලකුණු 02)

(ii) සේව්‍ය - සේවක හා ගිහි පැවිදි සබඳතාව දක්වා ඇති දිශාවන් නම් කරන්න. (ලකුණු 03)

(iii) සේවකයා විසින් ස්වාමියාට ඉටුකළ යුතු යුතුකම් පහ ලියා දක්වන්න. (ලකුණු 05)

05. (i) සතර බ්‍රහ්ම විහරණ අතුරින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉහතින් දක්වන ලද එක් කරුණක් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) බ්‍රහ්ම විහරණවලින් යුතු පුද්ගලයාට අයත්වන වාසි පහක් ලියන්න. (ලකුණු 05)

06. (i) අත්තනාව කතං පාපං.... යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

(ii) එම ගාථාවේ තේරුම ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) ධම්මපද ගාථා මගින් පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට ලබා දෙන උපදෙස් පහක් ලියන්න. (ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(i) බලංගොඩ ආනන්ද මෛත්‍රීය හිමි.

(ii) යථාවාදී තථාකාරී බව හා යථාකාරී තථාවාදී බව.

(iii) අත්තූපනායික ධර්ම පර්යාය.

(iv) අටමස්ථාන. (ලකුණු 2 x 5 = 10)